# ප්‍රගති සාරාංශය

# 2018

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව CIABOC

# 2018

අල්ලස් කොමිෂන් සභාව පසු කරමින් සිටින්නේ පරිවර්තනීය යුගයකි. ඒ අතරින් ප්‍රධාන වන්නේ පැමිණිලි මෙහෙයවීම් සහ විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ඉහළම වෘත්තීමයභාවයක් මේ වන විට අත්පත් කර ගෙන සිටීමයි. එසේම ඉතිහාසයේ ප්‍රථම වතාවට විශේෂඥ විමර්ශකයන් බඳවා ගැනීමත්, නිවාරණ නිලධාරීන් බඳවා ගැනීමත්, නීති සහකාරවරුන් බඳවා ගැනීමත් සඳහා කටයුතු ආරම්භ කර ඇත. තවද අවුරුදු 25 කට පසුව නීති සංශෝධන කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී. ජාතික වැඩපිළිවෙලක් සකස් කිරීමත් අන්තර්ජාතික සබඳතාවයන් වැඩිදියුණු කිරීමත් මෙම වසර තුළ දී සිදු වූ ඉතාමත් වැදගත් කාර්යයන් වේ. ඒ සියල්ලටම වඩා ස්වාධීන සහ අපක්ෂපාතීභාවය අතින් ඉහළම ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට අල්ලස් කොමිෂන් සභාව සමත් වී සිටී.

# 2018 වර්ෂයේ අල්ලස් කොමිසමේ ප්‍රගතිය ........

## 01. විත්තිකරුවන් වරදකරුවන් කිරීම

2018 වර්ෂයේ දී අධිකරණයේ සාර්ථක ලෙස නඩු මෙහෙයවීමේ ප්‍රතිඵලයක් ලෙස 64 දෙනෙකු විත්තිකරුවන් වරදකරුවන් කරවීමට හැකි වී ඇත. 2017 වර්ෂයේ දී එම සංඛ්‍යාව 57 කි. මෙය සන්සන්දනය කළ යුත්තේ 2005 සිට 2010 දක්වා වූ කාල පරාසයත් සමඟ ය. බොහොමයක් අවස්ථාවල දී, එම කාලය තුළ වසරකට අධිකරණය මගින් වරදකරුවන් කළ විත්තිකරුවන් සංඛ්‍යාව 15 සිට 20 දක්වා වේ. ඒ අනුව හුදෙක් නඩු පැවරීම් නොව පවරන නඩුවල දී විත්තිකරුවන් වරදකරුවන් බවට පත් කිරීම ඉලක්ක කර ගෙන අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් පැමිණිලි මෙහෙයවා ඇත.




## 02. නඩු පැවරීම

අල්ලස් කොමිෂන් සභාවට නැගෙන ප්‍රධාන චෝදනාවක් වන්නේ සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින පරිදි සුළු තානාන්තර දරණ අයට එරෙහිව ඔවුන් පමණක් ඉලක්ක කර ගනිමින් නඩු පවරන බවයි. නමුත් පසුගිය දෙවසර පරීක්ෂා කිරීමේ දී හිටපු නීතිපති, හිටපු අභියාචනාධිකරණ විනිශ්චයකාර, හිටපු ඇමතිවරු තිදෙනෙක්, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාවේ සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපති, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ, ලක්සල සභාපති, ලක්සල කළමනාකාර අධ්‍යක්ෂ, ලක්සල අධ්‍යක්ෂ මුදල්, ලක්සල ව්‍යාපෘති අධ්‍යක්ෂ, හිටපු දිසා විනිසුරු, විදුලි අධිකාරී, ඇවන්ගාඩ් සභාපති, යුධ හමුදාවේ හිටපු බ්‍රිගේඩියර්වරයෙක්, රේගු අධිකාරී, සහකාර රේගු අධිකාරී, හිටපු නගරාධිපති, හිටපු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වැනි ඉහළ තනතුරු දරණ නිලධාරීන්ට ද නඩු පැවරීම් සිදු කර ඇත. ඇවන්ගාඩ් සභාපති සහ හිටපු බ්‍රිගේඩියර්වරයෙකුට විරුද්ධව අල්ලස් ලබා දීම හා අල්ලස් ලබා ගැනීම යන වැරදි දෙකටම එකම නඩුවේ චෝදනා ගොනු කරමින් සුවිශේෂී නඩුවක් ද පවරා ඇත.

## 03. වැටලීම්

**2018 වසර තුළ වැටලීම් සිදු කොට අල්ලස් ගන්නා අවස්ථාවල දී සැකකරුවන් 40 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. එසේ අත්අඩංගුවට ගත් සැකකරුවන් අතර රාජ්‍ය තන්ත්‍රයේ ඉහළම රාජ්‍ය නිලධාරීන් ද ආනයන අපනයන පාලක, දැව සංස්ථාවේ සභාපති, පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති, ජ්‍යෙෂ්ඨ තක්සේරුකරු, විදුලි අධිකාරී හා පොලිස් පරීක්ෂක වැනි තනතුරු දරණ අය ද වූහ.**

## 04. ලැබෙන පැමිණිලි වල ස්භාවය

අල්ලස් කොමිසමට සාමාන්‍යයෙන් විශාල පරිමාණයේ අල්ලස් චෝදනා පිළිබඳ පැමිණිලි ලැබෙන්නේ සුළු වශයෙනි. එයට හේතුව එවනි චෝදනා වලට සම්බන්ධය විත්තිකරුවන් ඉහළ තනතුරු දරණ පුද්ගලයින් වීම නිසා එවැනි අයට විරුද්ධව පැමිණිලි ඉදිරිපත් කිරීමට ඊට අදාළ පාර්ශව ඉදිරිපත් නොවීමයි. නමුත් කොමිෂන් සභාව වෙත සාමාන්‍ය දූෂණ පිළිබඳ පැමිණිලි විශාල සංඛ්‍යාවක් නිරන්තරයෙන් ලැබෙයි. පොදුවේ ගත් කල සාමාන්‍ය දූෂණ චෝදනා වල මූල්‍ය වටිනාකම විශාල දූෂණ චෝදනා වල මූල්‍ය වටිනාකමට වඩා වැඩි අගයක් ගනී. කෙසේ වෙතත් 2018 වර්ෂයේ දී අල්ලස් කොමිසමට ලද මුළු පැමිණිලි සංඛ්‍යාව 3465 කි.

## 05. විමර්ශන නිලධාරීන් බඳවා ගැනීම

**අල්ලස් කොමිෂන් සභාවේ පසුගිය වසර 25 මුළුල්ලේම විමර්ශන කටයුතු සිදු කළේ පොලිස් නිලධාරීන් විසිනි. එහෙත් ඉතිහාසයේ පළමු වතාවට විශේෂඥ නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව ගණකාධිකරණය, විගණනය, මූල්‍ය විශ්ලේෂණය, ඩිජිටල් විමර්ශන, බැඳුම්කර, ආරක්ෂණ, බැංකු කරණය, ජාත්‍යන්තර සම්මුතීන්, ප්‍රසම්පාදනය, ඉදිකිරීම්, ඉංජිනේරු විද්‍යාව, කළමනාකරණය හා රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍ර වලට අයත් විශේෂඥයින් 200ක් බඳවා ගැනීමට රාජ්‍ය යන්ත්‍රණය හරහා අනුමැතිය ලබා ගෙන ඉල්ලුම් පත්‍ර කැඳවන ලදී. ඉල්ලුම් පත්‍ර 8000 කට වැඩි සංඛ්‍යාවක් ලැබුණු අතර විභාග කොමසාරිස් තුමා ඔවුන් හට බුද්ධි පරීක්ෂණ විභාගයක් 2018 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී පවත්වා ඇත. නමුත් මේ වන තෙක් විභාග දෙපාර්තමේන්තුවෙන් අදාළ ප්‍රතිඵල ලේඛනය නිකුත් කර නැත.**

## 06. නිවාරණ නිලධාරීන් බඳවා ගැනීම

**අල්ලස් කොමිෂන් සභාවේ මේ වන තෙක් අවධානය යොමු කළේ විමර්ශනය සිදු කිරීම හා නඩු පැවරීමේ කාර්යයට පමණක් වුවත් අල්ලස දූෂණය තුරන් කළ ලෝකයේ බොහෝ රටවලින් ලත් අත්දැකීම් අනුව නිවාරණ ඒකකයක් පිහිටුවීමට කටයුතු යොදා ඇත. ඒ අනුව නිවාරණ නිලධාරීන් 50 දෙනෙක් බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගෙන ඔවුන් සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවා ඇත. එම තනතුරු සම්බන්ධයෙන් ඉල්ලුම්පත්‍ර 5000 කට වැඩි සංඛ්‍යාවක් ලැබී ඇති අතර ඔවුන් සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ අවසන් කර ඇත.රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද විගස ඔවුන් බඳවා ගැනීමට කටයුතු කරණු ඇත.**

## 07. නීති සංශෝධන

අල්ලස් කොමිෂන් සභාව ඉතිහාසයේ පසුගිය අවුරුදු 25 ටම පවතින නීතිවල කිසිදු සංශෝධනයක් කර නොමැති බැවින් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. මෙතෙක් දූෂණ නඩු විභාග කිරීමේ බලය මහේස්ත්‍රාත් අධිකරණයට සීමා වුවද මින් ඉදිරියට එම නඩු මහාධිකරණය ඉදිරියේ දී ද විභාග කල හැකි අයුරින් නීතිය සංශෝධනය කර ඇත.

- **අල්ලස් පනත**

පුද්ගලික අංශයේ අල්ලස්, ලිංගික අල්ලස්, ක්‍රීඩා කටයුතු වල අල්ලස්, විදේශීය රාජ්‍ය සේවකයන් සම්බන්ධ අල්ලස් යන ක්ෂේත්‍ර අළලා අල්ලස් නීතිය සංශෝධනය කිරීමේ කටයුතු මේ වන විටත් නීති කෙටුම්පත් සම්පාදකතුමිය සිදු කරමින් සිටී.

- **ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත**

මෙම පනත සංශෝධනය කිරීමට අදාළ කෙටුම්පත පාර්ලිමේන්තුවේ අනුමත වී ඇත. මෙම සංශෝධනයේ ප්‍රතිඵලය වන්නේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවකින් හෙළිදරව් වූ සාක්ෂි අධ්‍යයනය කොට නඩු පැවරීමේ බලය අල්ලස් කොමිෂන් සභාව වෙත ලබා ගැනීමය. ඒ අනුව එම සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අල්ලස් කොමිෂන් සභාව විසින් නැවත සටහන් කිරීමේ අවශ්‍යතාවයක් පැන නඟින්නේ නැත.

- **වත්කම් බැරකම් නීතිය**

මීට අදාළ සංශෝධනයන් සිදු කිරීම සඳහා දේශීය හා විදේශීය විශේෂඥයන් සමඟ සාකච්ඡා වාර ගණනාවක් පවත්වා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස නීති කෙටුම්පත් සම්පාදකතුමිය විසින් මේ වන විටත් අදාළ නීතිය කෙටුම්පත් කිරීමේ කටයුත්ත සිදු කරමින් සිටී. තව ද වර්තමානයේ පවතින අල්ලස් කොමිෂන් සභා පනතේ ද අඩුලුහුඩුකම් ගණනාවක් පවතින බැවින් ඒවා පිළි සකස් කොට එම පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කෙටුම්පත් මේ වන විට නීති කෙටුම්පත් සම්පාදකතුමිය සකස් කරමින් සිටී.

- **අල්ලස් හෝ දූෂණ චෝදනා කොමිෂන් සභා පනත**

මෙම පනත සංශෝධනය කිරීම මඟින් දූෂණ නිවාරණ බලතල කොමිෂන් සභාවට ලැබෙනු ඇත. එවිට ලෝකයේ සාර්ථක කොමිෂන් සභා ක්‍රියාත්මක වන රටවල මෙන් අල්ලස් කොමිසමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඍජුවම පාර්ලිමේන්තුවෙන් වෙන් කර ගැනීමට හැකි වනු ඇත.

එමගින් නීති නිලධාරීන්ට, විමර්ශන නිලධාරීන්ට හා නිවාරණ නිලධාරීන්ට විධිමත් පුහුණුවක් ලබා දීමටත්, කොමිෂන් සභාවට විශේෂඥයින්ගේ සේවය පහසුවෙන් ලබා ගැනීමට හැකි වනු ඇත.

එසේම විමර්ශන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික මෙවලම් සපයා ගැනීම ද පහසු වෙනු ඇත. මෙසේ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීමෙන් අල්ලස් දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තව දුරටත් ඉහළ යනු ඇත.

## 08. පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම

අල්ලස දූෂණය මෙරටින් තුරන් කිරීම සඳහා මෙතෙක් පැවති ප්‍රබල පසුබෑමක් වූයේ ඒ සඳහා නිසි සැලැස්මක් නොතිබීමය. එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී ප්‍රඥප්තියේ සාමාජික රටක් ලෙස ජාතික වැඩපිළිවෙලක අවශ්‍යතාවය අමාත්‍ය මණ්ඩලයෙන් හඳුනා ගෙන එය සකස් කිරීමේ වගකීම අල්ලස් කොමිෂන් සභාව වෙත භාර දී ඇත. ඒ අනුව දිවයින පුරා විද්වත් කතිකා 50 කට ආසන්න ප්‍රමාණයක් පවත්වා ඇති අතර ඉන් අවස්ථා 04 ක් පවත්වා ඇත්තේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී ය. ඒ අනුව මහජන නියෝජිතයන් හට තම අදහස් පළ කිරීමට අවස්ථාව ලබා දී ඇත. රාජ්‍ය නිලධාරීන්, වෘත්තිකයන්, සිවිල් සංවිධාන, කලාකරුවන් ආදී සෑම ක්ෂේත්‍රයකින්ම ලත් අදහස් අනුව ක්ෂේත්‍ර 04 ක් සම්බන්ධයෙන් ඉදිරි වසර 05 තුළ ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සැලැස්ම 2019 වර්ෂයේ මාර්තු මස 18 වන දින අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් දියත් කිරීමට කටයුතු සූදානම් කොට ඇත. එම ක්ෂේත්‍ර 04 නම් නිවාරණය, යහපත් ආකල්ප වර්ධනය කිරීම, විමර්ශනය හා පැහැදිලි ශක්තිමත් කිරීම සඳහා වන නීති හා නව නීති සහ ප්‍රතිපත්ති හඳුන්වා දීම ය.

තවද අල්ලස දූෂණය තුරන් කිරීමේ ලා ඉතාමත් ම තීරණාත්මක සාධකයක් වන කරුණු සම්බන්ධයෙන් ද සකස් කරන ලද ග්‍රන්ථ 04 ක් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමඟ නිකුත් කිරීමට බලාපොරොත්තු වේ. මෙම ග්‍රන්ථ 04 නම්,

i. ත්‍යාග රීති අඩංගු යෝජනා කෙටුම්පත

ii. බැඳියා වන් අතර සට්ටනයට අදාළ රීති අඩංගු කොට සාදන ලද යෝජනා කෙටුම්පත

iii. රාජ්‍ය නිලධාරීන් සඳහා සුපිළිපන්න බවේ අත්පොත

iv. අල්ලස් වත්කම්, බැරකම්, කොමිෂන් සභා මැතිවරණ ප්‍රචාරණ සහ හඬ නඟන්නන්ට අදාළ නීති කෙටුම්පත් යෝජනා

ඒ අනුව ජාතික වැඩපිළිවෙල සහ ඉහත ග්‍රන්ථ 4 දියත් කිරීමට සැලසුම් සකස් කොට ඇත. ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ මෙම ග්‍රන්ථ 4 ද්‍රවිඩ හා ඉංග්‍රීසි භාෂාවෙන් ද පරිවර්තනය කර ඇත. ඒ අනුව ග්‍රන්ථ 15 ක් එළිදැක්වීම සඳහා සූදානමින් සිටී.

## 09. ජාතික සුපිළිපන්න වැඩ පිළිවල

ජාතික සුපිළිපන්න වැඩ පිළිවල යටතේ විනිවිදභාවයෙන්, වගකීමෙන් හා වගකීමෙන් යුතු අවංක රාජ්‍ය සේවයක් ඇති කිරීම, අල්ලස් හා නිවාරණ ක්‍රමවේද පිළිබඳ රාජ්‍ය සේවකයින් දැනුවත් කිරීම, සාක්ෂි හා තොරතුරු සැපයීම සඳහා රාජ්‍ය නිලධාරීන් හා සමාජය උනන්දු කර වීම, දූෂණයට එරෙහිව අනතුරු හඟවන්නන් ලෙස කටයුතු කිරීමට පුරවැසියන් උනන්දු කර වීම සහ සාක්ෂිකරුවන්, තොරතුරු සපයන්නන් හා අනතුරු හඟවන්නන් ආරක්ෂා කිරීම හා ඔවුන් වෙනුවෙන් පෙනිසිටීම ආදී අරමුණු ඉටු කර ගැනීම සඳහා පිළියෙළ කොට ඇති ජාතික සුපිළිපන්න සැලැස්ම හා ක්‍රියාකාරකම් , අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව මගින් ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත.

## 10. අන්තර් ජාතික සබඳතා / බැඳීම්

පසුගිය වසර තුළ අන්තර්ජාතික අවධානය සහ සහයෝගීතාවය අල්ලස් කොමිෂන් සභාව වෙත නොමඳව ලැබුණි. ඒ අනුව GSP+ සහනය ලබා ගැනීමේ දී අල්ලස් කොමිසමේ සක්‍රීය දායකත්වය විදේශ අමාත්‍යාංශයට ලබා දී යුරෝපා කොමිසමට ගොස් අල්ලස් කොමිෂන් සභාව විසින් සාර්ථක ලෙස කරුණු ඉදිරිපත් කිරීමට හැකි විය. අල්ලස් කොමිෂන් සභාවේ විශේෂඥතාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය නිරන්තරයෙන්ම ඉදිරිපත් වී ඇත. අල්ලස් කොමිෂන් සභාවේ ප්‍රගතිය ඇගයීමක් වශයෙන් එක්සත් ජාතීන්ගේ විශේෂඥ කණ්ඩායමේ රැස්වීමට 2018 වසරේ ජූලි මස කොළඹ දී විදේශ විශේෂඥයන් 35 කගේ සහභාගිත්වයෙන් පවත්වන්නට හැකි විය. එහි දී ලොව පුරා පිහිටි අල්ලස් කොමිෂන් සභාවල ස්වාධීනත්වය හා ක්‍රියාශීලීත්වය වැඩිදියුණු කිරීම සඳහා 2012 වසරේ දී ඉන්දුනීසියාවේ ජාකර්තා නුවර දී එළි දක්වන ලද ජාකර්තා ප්‍රකාශය තවදුරටත් විවරණය කිරීම සිදු විය. ඒ අනුව ඉතා ඉක්මනින් ම ඊට අදාළ "කොළඹ විවරණය" එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් එළි දැක්වීමට නියමිතය.

## 11. නිලධාරීන්ට විශේෂ පුහුණුවක් ලබා දීම

විමර්ශකයන් සහ නීති නිලධාරීන් පුහුණු කිරීම සඳහා මැලේසියාව, හොංකොං, භූතානය, කොරියාව, ජපානය, චීනය යන රටවලට යැවීමට කොමිෂන් සභාවට හැකි වී ඇත. කොමිෂන් සභාවේ නිලධාරීන් හට 2019 වසරේ දී ඉතා ගැඹුරින් පුහුණුව ලබා දීම සඳහා හොංකොංහි කොමිෂන් සභාව විසින් දැනටමත් කැමැත්ත පළ කර ඇත. අල්ලස දූෂණය තුරන් කළ සාර්ථක රටවල් අනුගමනය කළ ක්‍රියාමාර්ග අධ්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ඉහළම රාජ්‍ය නිලධාරීන්ට අවස්ථාව ලබා දීමටත් එම කටයුතු සංවිධානය කිරීමටත් මෙම කොමිෂන් සභාවට හැකි විය. ඒ අනුව නීතිපති තුමා, ජනාධිපති ලේකම්තුමා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්තුමා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමා හා නීති කෙටුම්පත් සම්පාදකතුමිය හට භූතානය හා හොංකොං යන රටවල අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන ලදී. මැලේසියාවේ සුපිළිපන් ආයතනයේ සභාපතිතුමා ලංකාවට කැඳවා ලංකාවේ ජ්‍යෙෂ්ඨතම රාජ්‍ය නිලධාරීන් සමඟ සාකච්ඡා වාර ගණනාවක් පවත්වා ඇත.

## 12. ප්‍රජාව දැනුවත් කිරීම

දිවයින පුරා පාසල් සිසුන්, තරුණයන් හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පසුගිය වසර තුළ වැඩසටහන් 67 ක් පවත්වා ඇත. එම කාර්යය නීති නිලධාරීන් හෝ විමර්ශන නිලධාරීන්ගේ රාජකාරියේ කොටසක් නො වූව ද ඔවුන්ගේ කැපවීම නිසා මෙම වැඩමුළු සාර්ථක කර ගැනීමට අවස්ථාවක් ලැබුණි. 2019 වසර සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය අලළා දැවැන්ත දැනුවත් කිරීමේ වැඩපිළිවෙළක් සංවිධානය කිරීමට අවශ්‍ය සාකච්ඡා පවත්වා ඇත.

## 13. නව කාර්යාලය ගොඩනැගිල්ලක් ඉදිකිරීම

අල්ලස් කොමිෂන් සභා පරිශ්‍රයේ පිහිටි එක් ගොඩනැගිල්ලක් කඩා වැටීමට ආසන්න තත්ත්වයකට පත් වී තිබීම නිසා ජනාධිපති ලේකම් කාර්යාලයේ මැදිහත් වීමෙන් කැප්පෙට්ටිපොළ මාවතේ පිහිටි

පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව පිහිටා තිබූ පැරණි ගොඩනැගිල්ලට විමර්ශන අංශයේ කොටසක් ගෙන යාමට සිදු විය. එසේම නුදුරේ දී ම බඳවා ගැනීමට නියමිත නිවාරණ නිලධාරීන් ද එම ස්ථානයේ ස්ථාන ගත කිරීමට අපේක්ෂා කෙරේ. අල්ලස් කොමිෂන් සභාව වෙනුවෙන් නව ගොඩනැගිල්ලක් සාදන තෙක් කැප්පෙට්ටිපොළ මාවතේ පිහිටි එම ගොඩනැගිල්ල භාවිතා කිරීමට අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. වර්තමාන කොමිෂන් සභා පරිශ්‍රයට යාබද භූමියේ ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට දැඩි සටනක් කිරීමට සිදු විය. ඒ අනුව අවුරුදු 1 ½ ක කාලයකට පසුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම භූමියේ ගොඩනැලිලක් ඉදි කිරීමට අනුමැතිය මේ වන විට ලබා දී ඇත.

## 14. අභියෝග

- **භාණ්ඩාගාරයෙන් ලැබෙන සීමිත මූල්‍ය ප්‍රතිපාදන**

රාජ්‍ය ආයතන වල නිලධාරීන්ට අල්ලස හා දූෂණය පිළිබඳ දැනුවත් කිරීම සඳහා 2019 වර්ෂය සඳහා රු. මිලියන 200 ලබා දීම අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇත. එසේම කොමිෂන් සභාවේ නීති නිලධාරීන්, විමර්ශන නිලධාරීන් හා නිවාරණ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන කටයුතු සඳහා 2019 වසරේ සිට ඉදිරි වසර 3 ක කාලයක් සඳහා වසරකට රු. මිලියන 200 බැගින් ලබා දීමට ද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. තව ද අල්ලස දූෂණය පිටු දැකීම සම්බන්ධ දැන්වීම්, වැඩසටහන්, විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණය කිරීමට රු.මිලියන 650 වෙන් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.

නමුත් මෙලෙස අමාත්‍ය මණ්ඩල අනුමැතිත් ලැබී තිබුන ද මෙවර අයවැයේ දී දූෂණ නිවාරණ කටයුතු සඳහා රු.මිලියන 100 පමණක් වෙන් කරන බව ප්‍රකාශ කරන ලදී. මුදල් අමාත්‍යාංශය විසින් අල්ලස් කොමිෂන් සභාව ද තවත් එක් රාජ්‍ය දෙපාර්තමේන්තුවක් සේ සලකා ප්‍රතිපාදන වෙන් කිරීම ආයතනයේ ප්‍රගතියට බාධාවක් වී ඇත.

වර්තමානයේ අල්ලස් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් සංඛ්‍යාව 200 කි. නීති නිලධාරීන්ගේ සංඛ්‍යාව 29 කි. රටේ ජන සනත්වයට සමානුපාතිකව මෙය ඉතාමත්ම අල්ප සංඛ්‍යාවකි. උදාහරණයක් වශයෙන් මිලියන 06 ක් පමණ ජනගහනයක් සිටින හොංකොං දේශයේ අල්ලස් කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් 1000 ක සංඛ්‍යාවක් ඇත. එම දේශයේ ජාතික අයවැයෙන් 0.282% ප්‍රමාණයක් එම කොමිෂන් සභාව වෙනුවෙන් වෙන් කර ඇත. ශ්‍රී ලංකාවේ අල්ලස් කොමිෂන් සභාවට වෙන් කර ඇත්තේ 0.014% ක ප්‍රමාණයකි.

- **නීතිඥවරුන් සඳහා අඩු වැටුප් තලයක තිබීම**

මෑතක දී නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට වැඩි වැටුපක් ලබා දීම නිසා දක්ෂ නීතිඥවරුන් එම ආයතනයට ආකර්ෂණය කිරීමට හැකි වී ඇත. අල්ලස් කොමිෂන් සභාවේ නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීම සඳහා කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප වීම කොමිෂන් සභාවේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන අභියෝගයක් වී ඇත.

- **විමර්ශන අංශය සඳහා මානව සම්පත සීමිත වීම**

අල්ලස් කොමිසමේ දූෂණ විමර්ශනය කරන අංශ 05 ක් ඇති අතර එම අංශයක සිටින විමර්ශන නිලධාරීන් ගණන දළ වශයෙන් 20 ක් පමණ වේ. එක් විමර්ශන අංශයකට විමර්ශනය කිරීමට දළ වශයෙන් ගොනු 700, 800 ක පමණ ප්‍රමාණයක් ඇත. සීමිත මානව සම්පත් නිසා සමහර අවස්ථාවල දී විමර්ශනවල ප්‍රමාදයක් ඇති වේ. 2017 වර්ෂය තුළ පැමිණිලි 2,768 ක් ලැබී ඇති අතර පැමිණිලි 3,425 ක් විමර්ශනය කර ඇත.2018.12.31 දින වන විට ලද පැමිණිලි 3,465 ක් වන අතර විමර්ශනය කරන ලද පැමිණිලි සංඛ්‍යාව 4,694 ක් වේ.